**ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල - 2021**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි ඡේද අංක 22 හා 27 (ආ) ප්‍රකාරව වක්‍ර ක්‍රමය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ණයගැති වෙනස්වීම රු.373,452 ක් හා ලැබිය යුතු මුදල් වෙනස්වීම රු.532,220 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වල කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම් යටතේ දැක්විය යුතු වුවත්, ඒවා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | 2022 වර්ෂයේ සිට ප්‍රමිතය අනුව ඉදිරිපත් කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතය අනුව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි ඡේද අංක 48 ප්‍රකාරව වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාර බිල්පත් මුළු එකතු වටිනාකම වූ රු.11,409,081 ක වටිනාකමින්, එදිනට ඉදිරියට ලැබූ භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම වූ රු.9,424 ක් හිලව් කර ශුද්ධ වටිනාකම වන රු.11,399,657 ක් ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | 2022 වර්ෂයේ සිට ප්‍රමිතය අනුව ඉදිරිපත් කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතය අනුව ක්‍රියා කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1996 ඔක්තෝම්බර් 24 දින අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1994 අංක 01 දරන චිත්‍රපට සංස්ථා නියෝග | | | |
| (i) 2 (4) (I) (ඉ) වගන්තිය | චිත්‍රපටවල උසස් ප්‍රමිතීන් සහතික කිරීම සඳහා, චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන උපකරණ සැපයීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා ඉල්ලීම් ඉදිරිපත්ව නැත. | ගැසට් නිවේදනයේ නියෝග අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 2 (4) (I) (ඊ) වගන්තිය | චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින කලාකරුවන්ට සහ කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව ලබාදීම හෝ පුහුණු වැඩසටහන් පැවැත්වීමට අරමුදල කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට එලෙස ඉදිරිපත් කරනු ලැබේ. | -එම- |
| (iii) 2 (4) (I) (උ) වගන්තිය | උසස් තත්ත්වයේ කලාත්මක චිත්‍රපට මුළුමනින්ම නිෂ්පාදනය කිරීම සඳහා තිර රචනා ඇගයීමේ කමිටුව විසින් අනුමත කරනු ලැබූ තිර රචනා හෝ එවැනි චිත්‍රපට නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ලබාගත හැකි ප්‍රභවයකින් විශේෂ උපකරණ කුලියට ලබා ගැනීම පිණිස අධ්‍යක්ෂවරුන්ට ණය මුදල් දීම මඟින් චිත්‍රපට නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | මේ සඳහා ඉල්ලීම් ඉදිරිපත්ව නැත. | -එම- |
| (iv) 2 (4) (I) (ඌ) වගන්තිය | වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා දේශීය චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින සහ චිත්‍රපට දහයකට අඩු නොවන ගණනක එම කටයුතු සම්පූර්ණ කර ඇති වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුනතා වැඩිකර ගැනීමට සහ දියුණුකර ගැනීමට ණය මුදල් | 2022 වසරේ සිට මූල්‍යාධාරයක් ලබාදීමට කටයුතු කරනු ඇත. | ගැසට් නිවේදනයේ නියෝග අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ඇතුලත් කල මුදල් රෙගුලාසි 872(2) (ඇ) | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 02 ක් ප්‍රමාදව 2022 මැයි 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේදී හා අනුමැතිය ගැනීමේදී ප්‍රමාදයක් සිදු විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,000,099 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,591,563 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.591,464 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අනෙකුත් ආදායම් රු.1,001,147 කින් එනම්, සියයට 19 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට සංවර්ධන අරමුදල මඟින් චිත්‍රපට නිෂ්පාදනය සහ සිනමාශාලා සඳහා එකතුව රු.73,155,724 ක ණය ලබාදී තිබූ අතර, එදිනට බොල් ණය සහ අඩමාණ ණය වෙන් කිරීම් එකතු වටිනාකම රු.67,268,372 ක් වීම හේතුවෙන් ශුද්ධ ණයගැතියන් රු.5,887,352 ක් විය. ඒ අනුව මුළු ණයගැතියන්ගෙන් සියයට 92 ක් අයකරගත නොහැකි ණය ලෙස හඳුනාගෙන තිබූ අතර, කර්මාන්තය බිඳ වැටීම කළමනාකරණය ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම සහ කළමනාකරණ අකාර්යක්ෂමතාව මේ සඳහා හේතු වී තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. | මෙම ණය මුදල් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සංවර්ධන අරමුදලේ බැංකු ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය පුරා මුදල් පොත අනුව පැවති වාසිදායක සාමාන්‍ය බැංකු ශේෂය රු.10,418,821 ක් විය. කිසිදු ඵලදායී ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් තොරව මෙම මුදල 2021 වර්ෂය පුරා බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යාව පැවති අතර, පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වාදී තිබියදී කෙටි කාලීන ආයෝජනයක නොයොදා වර්ෂයක් පුරා ජංගම ගිණුමේ නිෂ්කාර්යාව පවත්වාගෙන ගොස් තිබුණි. | 2022 වසරේ සිට ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1996 ඔක්තෝම්බර් 24 දින අංක 946/9 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, 1994 අංක 01 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ සංශෝධිත නියෝග ප්‍රකාරව චිත්‍රපට කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා මෙම අරමුදල පිහිටුවා තිබුණි. නමුත්, 2021 වර්ෂය තුළ පාලක මණ්ඩල රැස්වීම් 02 ක් පවත්වා තිබුණද, කල් පිරෙන ආයෝජන ප්‍රති ආයෝජනය කිරීම සහ ණය අයකර ගැනීමට උත්සාහ කිරීම හැර සිනමා කර්මාන්තයේ උන්නතිය උදෙසා සක්‍රිය දායකත්වයක් වර්ෂය තුළ අරමුදල මඟින් ලබාදීමට අවශ්‍ය තීරණ ගෙන නොතිබුණි. | 2022 දී පාලක මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර ඒ සඳහා පියවර ගනු ලැබේ. | අරමුදලේ සංශෝධන නියෝග ප්‍රකාරව කර්මාන්තය සංවර්ධනය සඳහා ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට සංස්ථාවෙන්, චිත්‍රපට සංවර්ධන අරමුදලට ලැබිය යුතු කුළී දායකත්වය රු.27,168,167 ක් විය. එදිනට සංවර්ධන අරමුදල සතු ජංගම වත්කම් වලින් සියයට 38 ක් වූ මෙම මුදල් සංස්ථාවෙන් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | සංස්ථාව වෙත වවුචර් යොමු කළද, මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මුදල් ලැබී නොමැත. | මෙම ලැබිය යුතු කුළී මුදල් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |